# කැස්බෑ ලොවෙන් බිඳක්



වෙනුලි නෙතුම්සා හරස්ගම

# කැස්බෑ ලොවෙන් බිඳක්

## චෙනුලි නෙතුම්සා හරස්ගම

කතෘ

### කතෘගේ වෙනත් කෘති

අකීකරු වඳුරු පැටියා
තන්තල් තෑග්ග
ලස්සන සමනලයා
මගේ චන්ඩි මල්ලියා
My Little Essyas

මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.
6-B ශ්‍රේණිය

10.05.2026

ISBN - 978-624-208-991-1

# පිදුම

දැනුමෙන් පෝෂණය කරන්නට
වෙර දරන,
මාගේ සදාදරණීය විදුහල්පතිතුමිය,
පංතිභාර ගුරුතුමිය
ඇතුළු ගුරු මව්පියන්ටත්,
මා පෝෂණය කරන
ඇතිදැඩි කරන
මාගේ මව්නි, පියාණෙනි ඔබ
දෙපලටත්,
මා වැනිම දැනුම හඹා යන
මාගේ සොයුරු කැළටත්
මෙ පොත ආදරයෙන් පුද කරමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුළු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති  හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන්  සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු   දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව
2026.05.10

# කැස්බෑ ලොවෙන් බිඳක්

මා පාසල් ඇරී ගෙදර ආ විට අම්මා පැවසූ දෙයින් මා ඉතාමත් සතුටට පත්විය. එනම් තව දවස් දෙකකින් අපි ගාල්ලේ යන බවයි. අපි එහි යන්නේ විවාහ මංගල්‍යය උත්සවයක් සඳහායි. අපි ගාල්ලේ දවස් කීපයක් නතර වෙන බවත් අම්මා පැවසුවා.

එහි දී අපි ගාලුකොටුව නැරඹීමට, කැස්බෑවුන් බැලීමට, කොරල්පර නැරඹීමට යාමට අදහස් කරන බව අම්මා කීවා.

මා ඉතාමත් ආසාවෙන් සිටින්නේ කැස්බෑවන් සහ කොරල්පර නැරඹීමට යාමටයි. අපට ගමන යාමට ඇති දිනය එනතෙක් මම ඇඟිලි ගනිමින් සිටියෙමි.

ගමනට කලින්  දා අම්මා අපේ සියළු ඇඳුම් සූදානම් කළා.

විවාහ මංගල උත්සවය සඳහා අවශ්‍ය ඇඳුම්ද අපි එහි දවස් තුනක්  නවතින නිසා ඒ සඳහා අවශ්‍ය ඇඳුම් ද අම්මා බෑග් වලට දමාගත්තා.

පසුදා උදේ බස් රථයක් අපේ නිවසට පැමිණියා. අපේ සියලු බඩුබාහිරාදිය එහි පටවා ගත්තා. පසුව ගාල්ලේ ඒමට අපි පිටත් වුණා.

අපි සවස දෙකයි තිහ පමණ වන විට ගාල්ලට පැමිණියා. පසුව අපි නවතින හෝටලය වෙත  පැමිණියා.

ගමන් විඩාව නිසා මල්ලී මායි ඇඟ සෝදාගෙන කෑම ගෙන නින්දට ගියා. පසුදා විවාහ මංගල්‍ය උත්සවය ඉතා උත්කර්ෂවත් අන්දමින් පැවැත්වුණා.

විවාහ මංගල උත්සවයෙන් පසු නැවතත් අපි නැවතී සිටි හෝටලයට පැමිණියා. පසුදා අපි ගාලු කොටුව නැරඹීමට පැමිණියා. ගාලු කොටුව ලන්දේසීන් විසින් බලකොටුවක් ලෙස භාවිතා කළ එකක් බව අත්තම්මා පැවසුවා.

එහි ලන්දේසි පල්ලිය, පැරැණි රජයේ නිවාස, ප්‍රදීපාගාරය සහ කෞතුකාගාරය බැලීමට අපි ගියා. ගාලු කොටුව ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ෂණය දිනාගත් ප්‍රධාන ස්ථානයක් බව අම්මා පැවසුවා.

ගාලු කොටුව නැරඹීමෙන් පසු නැවතත් අප නැවතී සිටි හෝටලය වෙතපැමිණියේ පසුදා අප කොරල්පර සහ කැස්බෑවන් බැලීමට යාමට කථිකා කරගෙනය. රාත්‍රී ආහාරයෙන් පසු අපි සියලු දෙනා නින්දට ගියා.

පසුදා අපි උදෑසන ආහාරයෙන් පසු කොරල්පර නැරඹීමට සහ කැස්බෑවුන් බැලීමට යාමට සූදානම් වුණා.

පළමුවෙන්ම අප ගියේ කැස්බෑවුන් බැලීම සඳහා හබරාදූව කැස්බෑ සංරක්ෂණ මධ්‍යස්ථානයට. ඇතුල්වීම සඳහා ටිකට්පත් ලබාගත් අපි කැස්බෑවන් බැලීම සඳහා ඇතුල්වුණෙමු.

එහිදී අපට කුඩා කැස්බෑ පැටවුන් කළු පාට සුදු පාට තටු නැති එක තට්ටක් පමණක් ඇති සහ ඇස් පේන් නැති කැස්බෑවන් දැක බලා ගැනීමට හැකිවුණා.

කැස්බෑවන් ගැන ගොඩක් විස්තර එහි සිටි මාමා කෙනෙක් අපට කියා දුන්නා.

ගොඩබිමේ ඉන්න කැස්බෑවන් ගමන් කරන්නේ හරිම හෙමින්ලු ඒත් කැස්බෑවන්ට මුහුදේ දී වේගෙන් පිහිනිය හැකිලූ. කැස්බෑවන්ගේ පාදවලට අවල් පත් කියලලු කියන්නේ. කැස්බෑව වර්ග ගොඩක් ඉන්නවලු.

පෙට්ටිකැස්බෑවා දාර කැස්බෑවා ලී කැස්බෑවා දිය කැස්බෑවා ඒ මාම තමයි කිව්වේ.

ගොඩබිමේ මුහුදේ ඉන්න කැස්බෑවන්ට ලොකු ඉතිහාසයක් තියෙනවාලු.

අනික කැස්බෑවොන්ට අවුරුදු සීයකට වැඩිය ජීවත් වෙන්න පුළුවන්ලු. කැස්බෑවන්ට ඉතා ඝනකටුවක් තියෙනවලු කට්ට තමාලු එයාගේ නිවහන වෙන්නේ. සතුරන්ගෙන් ආරක්ෂා වෙන්නත් ඒක යොදා ගන්නවලු.

මම ඇහුවා ඒ මාමාගෙන් "ඉබ්බයි කැස්බෑවයි දෙන්නම එක වගේ නේද "කියලා, ඒ මාමා කිව්වා , ඉබ්බා ජීවත්වෙන්නේ ගොඩබිමේ පමණයි. ඉබ්බා ජලජ ජීවිතයට හුරුවී නැති බවත්, පාද කැස්බෑ පාදවලට වඩා වෙනස් බවත් ඒ මාමා කිව්වා.

කැස්බෑවන්ට දත් නෑලු, කැස්බෑවන්ට තියෙන්නේ ශක්තිමත් හකු දෙකක්ලු. ගොළුබෙල්ලන් මාළුන් පණුවන් මුහුදු ශාක කුරුමීනියන් කකුළුවන් කස්බෑවන් ආහාර ලෙස ගන්නවලු.

ගෑණු කැස්බෑවන් ගොඩබිම් වලක් හාරලා බිත්තර දානවලු. ගැහැණු කැස්බෑවන් බිත්තර රකින්නෙත් නැල්ලු.

මාස දෙක තුනකින් කැස්බෑ පැටවුන් එළියට එනවලු. එළියට ආ විගස ඒ කැස්බෑ පැටවුන් මුහුද සොයා දිව යනවලු. ඒ යන අතරමග කකුළුවන්ට මුහුදු ලිහිණීන්ට එහෙමත් ගොදුරු වෙන්න පුළුවන්ලු.

අපිට දැක ගන්න පුළුවන් වුණා ආබාධ සහිත කැස්බෑවන්.

ඒ මාමා කිව්වේ විශාල මාළු දැල්වලට හසුවූ කැස්බෑවන් පාද  අහිමිවෙලා එක් පාදයක් පමණක් ඉතිරි වෙලා ඇස් දෙකටම හානි වෙලා එක් ඇසක් පමණක් ඉතිරි වෙලා ඉන්න කැස්බෑවුනුත් ඉන්නවා කිව්වා. සමහර කැස්බෑවන්ට ජලයට විෂ එක්උනහමත් එහෙම වෙලා තියෙනවා කිව්වා.

ඒ මාමා කිව්වා කැස්බෑවන් වඳවීම වළක්වා ගන්න නම් ජලයට විෂ ද්‍රව්‍ය  එක්කිරීම වැළැක්වීම, කැස්බෑ මස් බිත්තර කෑම වැලැක් වීම යම්තාක් දුරකට කැස්බෑවන් ආරක්ෂා කරගන්න පුළුවන් කියලා.

මට හරියට දුක හිතුණා ආබාධ සහිත කැස්බෑවන් ගැන.

අපි ඒ මාමත් එක්කම කොරල්පර නැරඹීමටත් බෝට්ටුවෙන් මුහුද මැදට ගියා.

මම අප ගිය බෝට්ටුවේ තිබුණු වීදුරුවෙන් කොරල් පර නැරඹුවා. හරිම ලස්සන ලෝකයක් මුහුද යට තියෙන්නෙ. පාට පාට කොරල්පර ලස්සනට තිබ්බා. කොරල්පර අස්සෙන් ලස්සන ලස්සන මාළු පීනා ගියා.

ඒ වගේ මට ගොඩක් සතුටු වුණා කැස්බෑවන් ගැන වගේම කොරල්පර නැරඹන්න පුළුවන් වුන එක ගැන වගේම ඇහැට දැක ගන්නත් පුළුවන් වුන එක ගැන.

ඒ මාමට ස්තූති කරලා අපි එතනින් එලියට ආවා. අපි නැවතත් අප නැවතී සිටි හෝටලය වෙත පැමිණීයා.


අම්මා පැවසුවා පසුදා උදෑසන අප නිවස කරා පැමිණෙන බව. මම ඉතාමත් නොඉවසිල්ලෙන් සිටියේ මාගේ පාසල් මිතුරියට මේ පිළිබඳ විස්තර පැවසීමටයි.














# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල් නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN - 978-624-208-991-1